# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/21 – 2018 ජූලි 03 වැනි අඟහරුවාදා – 2018.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 150 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2017/එච්ඩබ්ලිව්/39.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/1/87/2017.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජූනි මස 20 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.** – ප්‍රාදේශීය ලේකම්, රිදීගම.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 529, පරගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උදන්විට ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක කේයූ/ආර්ඩීජී/2017/193 හා 2017.05.18 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් පහත ඉඩම් කැබලිවලට මායිම් :

01. **කැබලි අංක 1– පරදළුපොත – ප්‍රමාණය: හෙක්. 1.6790**
උතුරට: ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය; නැගෙනහිරට: මැල්සිරිපුර ගොවිපළට අයත් පරදළුපොත වත්ත සහ අයි. එන්. ජෝන් හිමිකම් කියන පරදළුපොත; දකුණට: කැබලි අංක 2 සහ අයි. එන්. කුසුමා ගුණවර්ධන හිමිකම් කියන කොස්ගහමුලගාල සහ අයි. එන්. ගාමිණී නිහාල් සෝමසිරි හිමිකම් කියන පරදළුපොත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: මැල්සිරිපුර ගොවිපළට අයත් පරදළුපොත වත්ත.

02. **කැබලි අංක 2 – පරදළුපොත – ප්‍රමාණය: හෙක්. 0.0007**
උතුරට: කැබලි අංක 1 සහ මැල්සිරිපුර ගොවිපළට අයත් පරදළුපොත වත්ත; නැගෙනහිරට: මැල්සිරිපුර ගොවිපළට අයත් පරදළුපොත වත්ත සහ අයි. එන්. ජෝන් හිමිකම් කියන පරදළුපොත; දකුණට: අයි. එන්. ජෝන් හිමිකම් කියන පරදළුපොත සහ අයි. එන්. කුසුමා ගුණවර්ධන හිමිකම් කියන කොස්ගහමුලගාල; බටහිරට: අයි. එන්. කුසුමා ගුණවර්ධන හිමිකම් කියන කොස්ගහමුලගාල සහ කැබලි අංක 1.

07 - 536